මගේ අංකය :-

එච්එම්/ඊ/8/4/4

සෞඛ්‍ය දේශීය වෛද්‍ය සහ

වනිතා කටයුතු

අමාත්‍යාංශය

සබරගමුව පළාත් සභාව,

නවනගරය, රත්නපුර.

2010.12.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,සබරගමුව,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,කෑගල්ල/රත්නපුර,

ආයතන ප්‍රධානීන්

**සබරගමුව පළාත් සභාවේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම (අභ්‍යන්තර අයදුම්කරුවන්)**

සබරගමුව පළාත් සභාවේ සෞඛ්‍ය දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙහි පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු වෙනුවෙන් සුදුස්සන් තෝරා බඳවා ගැනීම පිණිස එම දෙපාර්තමේන්තුව යටතේ ඇති ආයතන වල සේවයේ නියුතු සුදුසුකම් ඇති සේවක සේවිකාවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. එක් එක් තනතුරට බඳවා ගැනීම පිණිස අවශ්‍ය සුදුසුකම් කවරේද යන්න සහ තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව පහත දක්වා ඇත. එකී තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති අයදුම්පත ප්‍රකාරව අයදුම්පතක් සකසා සම්පූර්ණ කර තම ආයතන ප්‍රධානියා මඟින් 2011.02.01 දිනට පෙර සබරගමුව පළාත් සභාවේ සෞඛ්‍ය දේශීය වෛද්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය. තනතුරු කිහිපයකට අයදුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතුය.

**ශිල්පීය නොවන ශ්‍රේණි**

## III ශ්‍රේණිය

1. සාමාන්‍ය කම්කරු තනතුර - පුරප්පාඩු 26
2. සනීපාරක්ෂක කම්කරු තනතුර - පුරප්පාඩු 25

i. බඳවා ගැනීමේ ක්‍රමය හා සුදුසුකම්

1. වයස අවු.18-45 අතර විය යුතුය. අභ්‍යන්තර බඳවා ගැනීම් වලදී උපරිම වයස් සීමාව බල නොපායි.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාල සීමාවක් ඇතුලුව සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
3. 08 ශ්‍රේණිය හෝ 09 වසර රජයේ පිළිගත් පාසලකින් සමත්ව සිටිය යුතුය.
4. මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
5. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

6. දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත ස්ථිර සනීපාරක්ෂක කම්කරුවකු හෝ අඛණ්ඩ දින 180ක සේවා කාලයක් ඇති අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/තාවකාලික/ දෛනික වැටුප් ලබන/ දීමනා ලබන පාසල් දන්ත චිකිත්සක කම්කරු සේවකයෙක් විය යුතුයි.

ii. <u>වැටුප් පරිමාණය</u> -11730-120x18-13890/=

iii. <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

1. දෙපාර්තමේන්තුවේ සේවයේ  නියුක්ත ස්ථිර සනීපාරක්ෂක කම්කරුවන්ගෙන් සහ අඛණ්ඩ දින 180ක සේවා කාලයක් ඇති අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/තාවකාලික/ දෛනික වැටුප් ලබන/ දීමනා ලබන පාසල් දන්ත චිකිත්සක කම්කරු සේවකයින්ගෙන් බඳවාගනු ලැබේ.
2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරාගෙන ලකුණු ලබා දීමේ පදනම මත රා.ප.ච.15/90 විධිවිධාන ද අනුගමනය කරමින් කුසලතාවය මත ප්‍රාථමික මට්ටමේ ශිල්පීය නොවන ශ්‍රේණියේ III වන ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගනු ලැබේ.
3. අදාල පුරප්පාඩු සඳහා සුදුස්සන් දෙපාර්තමේන්තුව තුල නොමැති විට එම ප්‍රමාණය ද බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.
4. පිරිමි අයදුම්කරුවන් පමණක් අවශ්‍ය තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන් ද ගැහැණු අයදුම්කරුවන් පමණක් අවශ්‍ය තනතුරු සඳහා ගැහැණු අයදුම්කරුවන් පමණක් ද ගැහැණු පිරිමි දෙවර්ගයම අවශ්‍ය තනතුරු සඳහා 50% බැගින්ද බඳවා ගනු ලැබේ.

## II ශ්‍රේණිය

1. ඉසීම් යන්ත්‍ර ක්‍රියාකරු තනතුර - පුරප්පාඩු 22
2. මුරකරු තනතුර - පුරප්පාඩු 07
3. ඇසුරුම්කරු තනතුර - පුරප්පාඩු 01
4. කාර්යාල කාර්ය සහයක - පුරප්පාඩු 02

i. <u>බඳවා ගැනීමේ ක්‍රමය හා සුදුසුකම්</u>

ශිල්පීය නොවන ශ්‍රේනියේ III ශ්‍රේණියේ තනතුරකට (සනීපාරක්ෂක කම්කරු, සාමාන්‍ය කම්කරු, සෞඛ්‍ය කම්කරු,සුනඛ නාශක කම්කරු, උද්‍යාන කම්කරු) ස්ථිරව බඳවා ගැනීමෙන් පසු වසර 06ක සේවය සම්පූර්ණ කරන අයට පහත සඳහන් සුදුසුකම් සපුරන්නේනම් II ශ්‍රේණියට උසස්වීම් සඳහා ඉල්ලුම් කල හැකිය.

1. III ශ්‍රේණියේ පත්වීම ස්ථිර කර තිබිය යුතුය.
2. වැඩ හැසිරීම හා පැමිණීම යහපත් විය යුතුය.
3. උසස් වීම සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්නයෙන් වූ වසර 05 ක කාලය සතුටුදායක සේවා කාලයක් ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. <u>වැටුප් පරිමාණය</u> - 13060-130 x14-14880/=

### iii. <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

1. සුදුසුකම් ලබන ඉල්ලුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතාවය මත සුවිශේෂී කාර්ය සාධනය යටතේ II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. අවශ්‍ය වුවහොත් ලිඛිත පරීක්ෂනයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. උසස්වීම් සඳහා සුදුසුකම් ලබා ගැනීමට මුළු ලකුණු සංඛ්‍යාවෙන් 60%ක් හෝ ඊට වැඩියෙන් ලබා ගත යුතුය.
2. තනතුරු වල පුරප්පාඩු සංඛ්‍යාවෙන් 65%ක් සම්මුඛ පරීක්ෂණ වලදී දක්වන කුසලතා අනුපිළිවෙලට තෝරා ගනු ලැබේ.
3. කාර්ය සාධනය යටතේ සුදුසුකම් නොලබන හා ඇගයීම් ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් නොවූ අය පරිපාටිය අනුව සුදුසුකම් සපුරන්නේ නම් පුරප්පාඩු සංඛ්‍යාවෙන් 35% සම්පූර්ණ කරනු ලැබේ.

## <u>අර්ධ ශිල්පීය ශ්‍රේණි</u>

## III ශ්‍රේණිය

01. උපස්ථායක තනතුර - පුරප්පාඩු 08
02. අරක්කැමි තනතුර - පුරප්පාඩු 01
03. රසායනාගාර කම්කරු - පුරප්පාඩු 01
04. දුරකථන ක්‍රියාකරු - පුරප්පාඩු 02
05. මැහුම් සේවිකා - පුරප්පාඩු 02

### i. <u>බඳවා ගැනීමේ ක්‍රමය හා සුදුසුකම්</u>

1. වයස අවු.18-45 අතර විය යුතුය. අභ්‍යන්තර බඳවා ගැනීම් වලදී උපරිම වයස් සීමාව බල නොපායි.
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාල සීමාවක් ඇතුලුව සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
3. 08 ශ්‍රේණිය හෝ 09 වසර රජයේ පිළිගත් පාසලකින් සමත් විය යුතුය.
4. මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
5. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
6. බඳවා ගනු ලබන තනතුරට අදාල විෂය ක්ෂේත්‍රය පිළිබඳ කුසලතාවයක් තිබිය යුතුයි.
7. දැනට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කරන ශිල්පීය නොවන ශ්‍රේණිවල (සනීපාරක්ෂක කම්කරු, සාමාන්‍ය කම්කරු, සෞඛ්‍ය කම්කරු,සුනඛ නාශක කම්කරු, උද්‍යාන කම්කරු,මුරකරු,විදුලි සෝපාන ක්‍රියාකරු, ඇසුරුම්කරු, කාර්යාල කාර්ය සහයක, ඉසීම් යන්ත්‍ර ක්‍රියාකරු, ඖෂධ නිෂ්පාදන කම්කරු,පොත් බැඳුම්කරු) ස්ථිර සේවකයෙකු විය යුතුය.

### ii. <u>වැටුප් පරිමාණය</u> - 12210-130 x18-14550/=

### iii. <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

1. පිරිමි අයදුම්කරුවන් පමණක් අවශ්‍ය තනතුරු සඳහා පිරිමි අයදුම්කරුවන් ද ගැහැණු අයදුම්කරුවන් පමණක් අවශ්‍ය තනතුරු සඳහා ගැහැණු අයදුම්කරුවන් පමණක් ද ගැහැණු පිරිමි දෙවර්ගයම අවශ්‍ය තනතුරු සඳහා 50% බැගින් ද බඳවා ගනු ලැබේ.

2. තනතුරට අදාලව පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකදී තම පලපුරුද්ද හා හැකියාව සනාථ කල යුතුය. අවශ්‍ය වුවහොත් මේ සඳහා ලිඛිත පරීක්ෂණයක්ද පවත්වනු ලැබේ.
3. අදාල පුරප්පාඩු සඳහා සුදුස්සන් දෙපාර්තමේන්තුව තුල නොමැති විට එම ප්‍රමාණය ද බාහිර අයදුම්කරුවන්ගෙන් බඳවා ගනු ලැබේ.
4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුස්සන් තෝරාගෙන ලකුණු ලබා දීමේ පදනම මතත රා.ප.ච.15/90 විධිවිධාන ද අනුගමනය කරමින් කුසලතාවය මත ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය ශ්‍රේණියේ III වන ශ්‍රේණියේ අදාල තනතුරු වලට බඳවා ගනු ලැබේ.
5. උපස්ථායක තනතුර සඳහා තෝරාගනු ලබන්නන් මාස 03 ක පූර්ව සේවා පුහුණුවකට යටත් වන අතර එහි අවසාන පරීක්ෂණය අසමත් වන්නන්ගේ තෝරා ගැනීම අහෝසි වනු ඇත.

## ශිල්පීය ශ්‍රේණි

### III ශ්‍රේණිය

1. සිනමා යන්ත්‍ර ක්‍රියාකරු තනතුර - 01

i. බඳවා ගැනීමේ ක්‍රමය හා සුදුසුකම්

1. 08 ශ්‍රේණිය හෝ 09 වසර රජයේ පිළිගත් පාසලකින් සමත් විය යුතුය.
2. බලයලත් ආයතනයක් හෝ පුද්ගලයෙකු වෙතින් අයදුම්කරුගේ ශිල්පීය නිපුණතාවය/ කාර්මික පුහුණුව/ දක්ෂතාව සනාථ කරන සහතිකයක් ලබා තිබිය යුතුය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක කාල සීමාවක් ඇතුලුව සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
4. වයස අවු.18-30 අතර විය යුතුය. අභ්‍යන්තර බඳවා ගැනීම් වලදී උපරිම වයස් සීමාව බල නොපායි.
5. මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
6. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
7. සේවයේ ස්ථිර කර ඇති සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවකයෙකු විය යුතුයි.

ii. වැටුප් පරිමාණය - 12470-130 x18-14810/=

iii. බඳවා ගැනීමේ ක්‍රමය

1. අයදුම්කරුවන් ක්ෂේත්‍රයට අදාල පැවැත්වෙන ප්‍රායෝගික පරීක්ෂණයකට භාජනය කරනු ඇත. අවශ්‍ය වුවහොත් මේ සඳහා ලිඛිත පරීක්ෂණයක්ද පවත්වනු ලැබේ.
2. සුදුසුකම් ලබන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව කුසලතා අනු පිළිවෙලට ප්‍රාථමික මට්ටමේ ශිල්පීය ශ්‍රේණියේ III ශ්‍රේණියේ අදාල තනතුරු වලට පත්වීම් ලබා දෙනු ලැබේ.

ජේ.ඒ. රංජිත්
ලේකම්
සෞඛ්‍ය දේශීය වෛද්‍ය සහ
වනිතා කටයුතු අමාත්‍යාංශය

## ආදර්ශ අයදුම් පත්‍රය

## සබරගමුව පළාත් සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රෝහල්වල

**................................... තනතුර සඳහා අයදුම් පත්‍රය**

01. I. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ):-
    II. මුලකුරුවලින් හැඳින්වෙන නම :-
02. ජාතික හැඳුනුම්පත් අංකය:-
03. උපන් දිනය :-
04. 2011.02.01 දිනට වයස අවුරුදු :- මාස:- දින:-
05. ස්ථිර පදිංචි ලිපිනය :-
06. පදිංචි දිස්ත්‍රික්කය :-
07. I. දැනට දරණ තනතුර:-
    II.එම තනතුරට පත් වූ දිනය :-
08. I. පත්වීම ස්ථිරද? / අනියම්ද?/ආදේශකද?/කොන්ත්‍රාත් ද?/ දීමනා පදනමද? යන වග:-
    II.ස්ථිර පත්වීමක් නම්,පරිවාස කාලය අවසානයේ ස්ථිර කර තිබේද?
09. මුල් පත්වීමේ දිනය:-
10. දැනට සේවයේ නියුතු ආයතනය:-
11. අධ්‍යාපන සුදුසුකම්:-

12. වෙනත් සුදුසුකම්:-

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් තහවුරු කරමි.

දිනය:- .................................
අයදුම්කරුගේ අත්සන

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අයදුම්කරු මෙම ආයතනයේ ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/දීමනා ලබන සේවකයෙකු ලෙස සේවය කරන බවද ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක/අසතුටුදායක බවද ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවද පසුගිය වසර 05/06 ඇතුලත ලැබිය යුතු වැටුප් වර්ධක සියල්ල ඔහු/ ඇය විසින් උපයා ගෙන ඇති බවද සහතික කරමි.

දිනය:- ..............................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
හා නිල මුද්‍රාව

**ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සහතිකය**

අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් පසු ගිය වසර 05/06 ඇතුලත ලැබිය යුතු වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති බවද සහතික කරමි.

දිනය:- .............................................
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ
අත්සන
හා නිල මුද්‍රාව

**පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සහතිකය**

ඉහතින් ප්‍රධානියා දක්වා ඇති තොරතුරු හා එකඟ වන බවද ඔහු/ඇය පසුගිය වසර 05/06 ඇතුලත ලැබීමට නියමිත සියළුම වැටුප් වර්ධක ලබා ඇති බවද ඔහුට/ඇයට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ගනිමින්/ගැනීමට අදහස් නොකරමින් පවතින බවද සහතික කරමි.

දිනය:- ............................................
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අත්සන
හා නිල මුද්‍රාව